# මගේ පුංචි ලේන් පැටියා



ප්‍රකාශනය

ජනුදි අමුණුගම

2 ශ්‍රේණිය - A

මහාමාය බාලිකා විද්‍යාලය - මහනුවර

ග්‍රන්ථ නාමය

ළමා කතන්දර

කතෘ

ජනුදි ඔමෙත්මා අමුණුගම

චිත්‍ර

ජනුදි ඔමෙත්මා අමුණුගම

කතෘ ප්‍රකාශනයකි

මුද්‍රණය 2023 නොවැම්බර්

ISBN 978-624-206-949-4

# පිදුම

සැමදාම මට දිරියක් වූ

මගේ අම්මාට අප්පච්චිටත්

මහාමාය බාලිකා විද්‍යාලයේ පළමු වසරේ මට

අකුරු කියාදුන්

ගයනි ඔලගන්වත්ත ගුරු මෑණියන්ටත්

වර්ථමානයේ මාගේ පංතිභාර ගුරු මෑණියන් වන

මංජුලා ප්‍රියංගිකා සුමණසිංහ ගුරු මෑණියන්ටත්

අදටත් මට අකුරු කියාදෙන

ආදරණීය නැන්දා තරංගනී අමුණුගම ගුරු මෑණියන්ට

හා මට මෙම අවස්ථාව ලබාදුන්

මහාමාය විදුහල් මෑණියන්ට

මගේ මේ පුංචි වෑයම

උපහාරයක් වේවා!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ අපේක්ෂාව වන්නේ ඵලදායි පුරවැසියෙක් සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සජීවී පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීමයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙනලෙස හැඩ ගැස්වීම අපගේ වගකිමයි . අධ්‍යාපන සහ වචනයේ සැබෑ අරුත දරුවන් තුළ ඇති කුසලතා එළි දැක්වීම යන්න මැනවින් පසක් කර ගත් මහාමාය බාලිකා විද්‍යාලයේ අප වසර ගණනාවක් විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ලේකණකරණය සහජයෙන්ම උරුම කර ගත් දියණියන් හඳුනාගෙන ඔවුන්ට මග පෙන්වමින් බහු විධ කුෂලතා ඔපවත් කරමින් අනාගතයට අවැසි ලේඛිකාවන් දායාද කරමින් සිටි. පාසලට වසර අසූ නවයක් පිරීම නිමිතිකොට ගෙනදියණියන් තුල ශාෂත්‍රීයහික්මීම මෙන්ම සාරධර්ම පොෂණ නිපුනතා සංවර්ධනයත් පාසලතුලින් සිදුවූ සමාජ මෙහෙවර හරහා අභිමානයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව බුදු රජාණන් වහව්සේ පිරිණිවන්පා වසර දෙදහස් පංසිය හැට හතර සංකේතවත් කරමින් ග්‍රන්ථ දෙදහස් පංසිය හැට හතරක් රචනි කර දළඳා වහන්සේට සිදු කරන ග්‍රන්ථ පූජෝපහාරය වෙනුවෙන් මෙම කෘතිය රචනා කරයි මෙම ග්‍රන්ථය රචනි කල දියණියට ලැබුණු අත්දැකීම ඇගේ අනිගත දිවියට ශක්තියක් වේවායා ප්‍රාර්ථනා කරන අතර පෙරවදන ඉදිරිපත් කරන්නට ලැබීම මා ලද භාග්‍යක් කොට සලකාමි. වර්ථමානයෙ ලොකය පුරා පැතිරෙන කොවිඩ් -19 වසංගත ත්තවය හෙතුවෙන් දරුවන් නිතර වු විෂය සමගාමි හා විෂය භාහිර ක්‍රියාකරාකම් සඳහා මග පෙන් වූ මහාමයා බාලිකා විදුහලේ ගුරු එම්.එම්. සෙනවිරත්න මහතාට ප්‍රශංසාත්මකව ස්තුතිය පලකරමි. දරුවන් සහ පාසල වෙනුවෙන් සමස්ථ පාසල් ප්‍රජාවම එක්ව සිදු කළ මෙම ව්‍යාපෘතියසඳහා නන් අයුරින් උපකාරකල සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරි නමමි.

විදුහල්පතිනි

ඊ.ඩබ්.එල්.කේ. එගොඩවෙල



# එදා වැහි දවසක්

# මල්ලී හයියෙන් කෑගැහුවා





මමයි අක්කියි දුවල ගියා
මල්ලිගේ කාමරේට




අපි දැක්කා මල්ලීගේ ඇඳ උඩ
පුංචි ලේන් පැටියෙක් ඉන්නවා




අපි ලේන් අම්මව සෙවුවා

හම්බවුණෝ නැහැ



අප්පච්චියි අම්මයි ගෙදර
ආ විගස විස්තරය කිවුවා



අප්පච්චි ලේන් පැටියට
පහන් තිරෙන් කිරි දෙන හැටි
කියලා දුන්නා

ටික දවසක් යනවිට
ලේන් පැටියා ලොකුවුණා
අපි පලතුරු දුන්නා.





දැන් අපේ ලේන් පැටියයි
මල්ලියි දෙන්නම හරිම දඟයි.



අපි ලේන් පැංචාව
වහලෙ උඩින් තිබ්බාම එයා
අපේ මල්ලි හොයාගෙන එනවා

දැන් එයා අපේ පවුලේ
කෙනෙක් කියලා අම්මා කිවුවා



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඍදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01